# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022**

**2024 දෙසැම්බර්/ 2025 ජනවාරි**

**මානවශාස්ත්‍ර පීඨය**

## සිංහල

**(නව නිර්දේශය)**

**සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමාව- SINH 28214**

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

### <u>1 කොටස</u>

01. පහත සඳහන් ඡේදවල අදහස ලිහිල් බසින් ලියා කතුවරයා සතු අවස්ථා නිරූපණ කුසලතාව පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න.

අ)

තෙමේ මැ දිවැ විඩා වැ අභිමානශුන්‍ය වැ මබස් අසා, මා බුදුබව් දැනැ කඩුව දමා මා පාපිටැ හී කළකම් ගෙවා වැඳ මාගේ ශාසනයෙහි මහණ වැ කෙලෙසුන් නසා රහත් වැ, තමා බිණූ පිරිත්හි අනුහසින් කෙළලක්‍ෂයක් සක්වළැ සතුන්ට උපද්‍රව දුරු කොට පස්වාදහසක් මුලුල්ලෙහි හිරුසඳු මෙන් ලොකප්‍රසිඬ වෙ''යි සිතා වදාරා කලට සුදුසු වූ කළ මනා බුඬකෘත්‍යය කොට අනඳ මහතෙරුන්වහන්සේ සේ සිනෙහැති සව්වන් නො කැඳවා, සැරියුත් මහතෙරුන්වහන්සේ සේ නුවණැති ඇති සව්වන් නො කැඳවා, මුගලන් මහතෙරුන්වහන්සේ සේ සෘද්ධි ඇති සව්වන් නො කැඳවා, අනුරුද්ධ මහතෙරුන්වහන්සේ සේ දිවැස් ඇති සව්වන් නො කැඳවා, රාහුල කුමාරයන් වැනි පුත්රුවන් නො කැඳවා, නන්ද කුමාරයන් වැනි දෙබහින්නන් දරුවන් නො කැඳවා, සෙසු නොඑක් ගුණෙන් වැඩී සිටි ඒ ඒ ශ්‍රාවකයන් නො කැඳවා, තුමූ මැ තමන්ගේ පරාක්‍රම තකා පාත්‍රචීවර ඇරැ ගෙණ බුදුරුවට සලකුණු වූ දෙතිස් මහාපුරුෂලක්‍ෂණ අශීත්‍යනුබ්‍යඤ්ජන කේතුමාලාබ්‍යාමප්‍රභා සඟවා ගෙණැ සඳැස්පිල් හකුළුවා ගොදුරුබිම්හි යන ස්වර්ණමයුරරාජයා සේ තුන්යොදුන් මඟට බැසැ ඒ සොරහු වසන වල්කඩට නුදුරුතන්හි හෝතෙරකට පැමිණියෝ ලු.

ආ)

ලීල් කොට හිස කේ බැඳ ගෙන රැ දෙ වරු වී පැරියා සේ ඇඟ මුළුල්ලෙහි ධූලි ගා ගෙන කළයක් හැරගෙන පැනට යන කෙල්ලක මෙන් කෙල්ලන් හා එක් ව ගෙන් පිටත් ව මිඬි වෙස් ගත් ලෙසට කොල්ලා සිටින තැනට ගියහ. ඒ කොලු ද ක්‍රියාවෙන් කුමක් වුව ත් ජාතීන් හා සම්පත්තීන් උතුම් තරම් ඇති සිටු දූවණියන් රෙදි කඩකින් වසාලූ මැණිකක් පරිද්දෙන් කැඳවා ගෙන දුරට ගොසින් එක් ගමෙක රඳා හිඳ අයට අඳයට සී සා ගෙන, වප් වපුට ගෙන දර පලා ගෙනවු ත් ජීවත් වෙති. සිටු දුවණියෝ ද කුස රජ ව උපන් බෝසතුන් ප්‍රභාවතියන් නිසා නිකෘෂ්ට ලෙසින් හැසිරුණු නියාවට හුදෙක් පිරිමිහු ම ගෑනුන් නිසා නිකෘෂ්ට ලෙස ඇවිදින්නෝ නො වෙති. ගෑනු ත් පිරිමින් නිසා නිකෘෂ්ට ලෙසින් හැසිරෙති යන්න හඟවන්නාක් මෙන් කළයෙන් පැන් ගෙනවු ත් තබමින් සිය අතින් ම පරමන් පිසමන් ආදි ය කෙරෙමින් තමන් යට කළ අකුසලයෙහි අනිෂ්ට විපාක ය වී බත් කමින් සිට හමු බත් කන්නා සේ අනුභව කරන්නට පටන් ගත්හ.

02. දඹදෙණි යුගයේ ගද්‍ය සාහිත්‍යය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

03. පහත සඳහන් කෘති අතරින් එකක් (01) පිළිබඳ ප්‍රමාණවයත් විග්‍රහයක් කරන්න.

අ) අමාවතුර
ආ) බුත්සරණ
ඇ) ධර්මප්‍රදීපිකාව

**නැතහොත්**

**සද්ධර්මරත්නාවලී** කතුහිමියන් උපමා භාවිතයෙහි ලා පළ කළ සාමර්ථ්‍යය නිදර්ශනාශ්‍රයෙන් පැහැදිලි කරන්න.

## 11 කොටස

04. "සිංහල නවකතාවේ ප්‍රභවය හා විකාසනය තත්කාලීන සමාජ සංස්කෘතික ප්‍රබෝධයෙහි ප්‍රතිඵලයකි" සනිදර්ශන ව විමසන්න.

05. බ්‍රිතාන්‍ය යටත්විජිත බල අධිකාරිය දේශීය පීඩිත ජන ප්‍රජාවගේ ජීවිතය වඩාත් තීව්‍ර ලෙස අර්බුදයට පත් කළ ආකාරය **බැද්දේගම** නවකතාවෙහි යථාර්ථවත් ව නිරූපිත ය" විභාග කරන්න.

06. **දියමන්ති මාලය** කෙටිකතා සංග්‍රහයේ අභිමත කතා දෙකක් (02) තෝරාගෙන ඒවායෙහි චරිත නිරූපණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

## 111 කොටස

07. සංස්කෘත නාට්‍ය සම්ප්‍රදාය කෙටියෙන් හඳුන්වා, කාලිදාසයන්ගේ **ශාකුන්තලය** පිළිබඳ අගැයීමක් කරන්න.

08. ඇරිස්ටොෆනීස්ගේ මැඩියෝ නාට්‍යයෙහි නිරූපිත සමාජ නිරීක්ෂණ සනිදර්ශන ව පරීක්ෂා කරන්න.

09. කලාංගයක් වශයෙන් චිත්‍රපටය සතු අනන්‍යතා ලක්ෂණ කවරේ දැයි නිදසුන් සහිත ව විභාග කරන්න.

10. "කාලීන සමාජ හා දේශපාලන යථාර්ථය නිරූපණය වන අයුරින් සිය සිනමා කෘති නිර්මාණය කළ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් ධර්මසේන පතිරාජ හැඳින්විය හැකිය." **පාරදිගේ** චිත්‍රපටිය ඇසුරෙන් විමසන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

*************************************